යා දල් ජලාලි වල් ඉක්රාම් යන පද භාවිතය අධිකව පිළිපදින්න.

අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- ප්රකාශ කළ බව අනස් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. “යා දල් ජලාලි වල් ඉක්රාම් -කීර්තියෙන් හා උපකාරත්වයෙන් යුත්තානනි- යන පද භාවිතය අධිකව පිළිපදින්න.“
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත - ඉමාම් නසාඊ එය වාර්තා කර ඇත - අහ්මද් එය වාර්තා කර ඇත]

මෙම හදීසයේ නියෝගයක් පැමිණ ඇත. එහි අර්ථය වනුයේ එම ප්රර්ථනාව පිළිපදින්න. එය අධික ලෙස පවසන්න යන්නය. එනම් ඔබගේ ප්රාර්ථනාවන්හි ඔබ කරන ප්රකාශයෙහි නිරතුරුව මෙය භාවිත කරන්න. එය ඔබේ දිවට පහසු ලෙස පත් කර ගන්න. අල්ලාහ්ගේ නාමයන් අතරින් එක් නාමයක් මත මෙය අන්තර්ගතව ඇත. එය උදාර නාමයක් යැයි සඳහන් වේ. හේතුව දේවත්වය හා පාලනය යන ගුණාංග සියල්ල එහි අන්තර්ගතව ඇති බැවිනි.

https://sunnah.global/hadeeth/si/show/3167